**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ප්‍රසිද්ධ කරන ලද ජනමාධ්‍ය අයිතීන් සහ ප්‍රමිතීන් පිළිබඳ ලියැවිල්ලට යෝජනා.**

සුනන්ද දේශප්‍රිය
සංස්කාරක,
ශ්‍රී ලංකා බ්‍රීෆ්, http://srilankabrief.org/

රංග කලන්සූරිය

අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
(අමාත්‍යාංශ ලේකම් වෙනුවට)
අංක 163,
කිරුළපන මාවත , කොළඹ 05
Email -ranga@dgi.gov.lk

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි මූලික අදහස</u>

දැන ගන්නට ඇති පරිදි ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ලියැවිල්ල පාදක වී ඇත්තේ විජයානන්ද ජයවීර විසින් සකස් කරන ලද පනත් කෙටුම්පතක් අනුවය. එකී කෙටුම්පත සකස් කිරීමට නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද සහභාගී වී ඇති අතර එහි සාමාජිකයකු වන මා හට එම කෙටුම්පත ලැබී තිබේ. එය නිල වශයෙන් ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් බාරගෙන ඇත්ද නැත්ද යන්න පැහැදිලි නැත. ප්‍රථමයෙන්ම එම කෙටුම්පත නිල ලියැවිල්ලක් ලෙස පිළිගෙන ඇත්ද නැත්ද යන්න ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ප්‍රසිද්ධ කළ යුතු ය. එවැනි තත්වයක් යටතේ සාකච්ඡාවට ගත යුත්තේ එම පනත් කෙටුම්පත ය.

උදාහරණයක් වශයෙන් 1994 වර්ෂයෙහි එවකට ජනමාධ්‍ය ඇමැතිවරයා වූ ධර්මසිරි සේනානායක විසින් පත් කරන ලද ජනමාධ්‍ය වෘත්තීයට අදාළ කමිටු හතරෙහි වාර්තා නිල ලියැවිලි වශයෙන් ප්‍රසිද්ධ කරන ලදී. එම වාර්තාවන්හි අන්තර්ගතයන් වර්තමානයටත් අදාළ වන බැවින් එම වාර්තාවන්හි එන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට මෙම රජය කටයුතු කළ යුතුය. විශේෂයෙන්ම ජනමාධ්‍ය නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ ආර්. කේ. ඩබ්. ගුණසේකර වාර්තාවෙහි සහ රජයට අයත් ස්වාධීන ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහි අයිතිය සම්බන්ධයෙන් සිදත් ශ්‍රී නන්දලෝචන වාර්තාවෙහි අඩංගු යෝජනා ක්‍රියාත්මක කළ යුතු බව අපි කියා සිටිමු.

ආණ්ඩුව විසින් මෙරට ජනමාධ්‍ය සම්බන්ධයෙන් කවර හෝ ප්‍රතිපත්තියක් සකස් කරන්නේ නම් ප්‍රථමයෙන්ම ක්‍රියාවට නැගිය යුත්තේ රජය විසින් පාලනය කරන පොදු දේපල ගනයට වැටෙන ජාතික රූපවාහිනී සංස්ථාව, ස්වාධීන ප්‍රවෘත්ති පත්‍ර සමාගම, ඉන්ඩිපෙන්ඩන්ට් ටෙලිවිශන් නෙට්වර්ක් සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව යන මාධ්‍ය ආයතන සම්බන්ධ ප්‍රතිසංස්කරණයන්ය. මෙම ආයතන අද පාලනය වන්නේ හුදෙක් බලයේ සිටින දේශපාලන පක්ෂයන්හි ප්‍රචාරක මාධ්‍ය ලෙසය. තමන් විසින් පවත්වාගෙන යනු ලබන මාධ්‍ය ආයතන දේශපාලන වශයෙන් පාවිච්චි කරන මෙම ආණ්ඩුවට රජයට අයත් නැති ජනමාධ්‍ය ආයතන සඳහා ආචාර ධර්ම සහ නීති පැනවීමට සදාචාරාත්මක අයිතියක් නැත.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි ඉහත සඳහන් ලියැවිල්ලට අප පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන්නේ එම ලියැවිල්ල පිළිගැනීමක් ලෙස නොව මෙරට ජනමාධ්‍ය ප්‍රජාතන්ත්‍රීයකරණය සඳහා ලැබී ඇති අවස්ථාවක් ලෙස සලකමිනි.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ යෝජනාව

1.ප්‍රවෘත්ති සහ තොරතුරු රැස්කිරීම හා බෙදා හැරීමට, මහජන යහපත සම්බන්ධ කරුණු වලදී විචාරාත්මක වාර්තාකරණයක නියැලීමට, මහජන මතය ගොඩනැගීමේ ක්‍රියාවලියට දායක වීමට ජනමාධ්‍යයට ඇති අයිතිය ද ඇතුලත්ව ජනමාධ්‍ය නිදහස පිළිගැනීම;

ශ්‍රී ලංකා බ්‍රීෆ් හි අදහස

මාධ්‍ය නිදහස යනු මූලික මානව හිමිකමකි. එබැවින් එම නිදහස අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුකූලව පිහිටුවිය යුත්තේ මෙරට ව්‍යවස්ථාව මගිනි. එබැවින් මෙම ජේදය එම ව්‍යවස්ථාමය වගන්තියට අදාළ කරගනිමින් ඉදිරිපත් කිරීම වැදගත්ය.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ යෝජනාව

2. ජනමාධ්‍ය ආයතනයක් වෙනුවෙන් ප්‍රවෘත්ති හා තොරතුරු රැස්කරන ජනමාධ්‍යවේදීන්ට හිතාමතා බාධා කිරීම දඬුවම් ලැබිය යුතු වරදක් වශයෙන් නීතිගත කිරීම;

ශ්‍රී ලංකා බ්‍රීෆ් හි අදහස

රටක නීතියේ පාලනය නිසි පරිදි ක්‍රියාත්මක වේ නම් ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තියම අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් විශේෂ නීති අවශ්‍යද යන්න අදාළ විශේෂඥ දැනුමැති පිරිස් විමසීම වැදගත්ය. අංක දෙක දැක්වෙන ඉහත වගන්තිය ව්‍යාකූලත්වයන්ට මඟපෑදිය හැකි අතර එවැනි නීතියක් ජනමාධ්‍යවේදීන් විසින්ම අවභාවිතයේ යෙදවීමට ඉඩ තිබේ. එබැවින් අවශ්‍යම නම් මෙම වගන්තිය මෙයට වඩා නිශ්චිත වීමද වැදගත්ය.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ යෝජනාව

3. ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සලසන විධික්‍රමයක් ඇති කිරීම;

ශ්‍රී ලංකා බ්‍රීෆ් හි අදහස

ඉතා වැදගත්ය. නමුත් මෙම වගන්තිය ද නිරවුල් සහ විස්තරාත්මක විය යුතුය. අනතුරුදායක වාර්තාකරණයන් සඳහා යැවෙන මාධ්‍යවේදින්ට අවශ්‍ය විශේෂ පුහුණුව සහ දැනුම යාවත් කාලීන කිරීමද ආරක්ෂක උපකරණ සැපයීම මෙන්ම රක්ෂණ ආවරණ සැපයීමද අවශ්‍යය.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ යෝජනාව

4. තොරතුරු ලබා ගැනීමේ රහස්‍ය ප්‍රභවයන් අනාවරණය නොකිරීමට ජනමාධ්‍යවේදීන්ට ඇති අයිතිය සුරක්ෂිත කිරීම;

ශ්‍රී ලංකා බ්‍රීෆ් හි අදහස

ඉතා වැදගත්ය.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ යෝජනාව

5. තොරතුරු වල රහසිගතභාවය පවත්වා ගැනීම මහජන යහපත පිණිස වඩා වැදගත් වන අවස්ථාවකදී හැර, ජනමාධ්‍ය ආයතනයක නියැලි ජනමාධ්‍යවේදීන්ට මහජන කටයුතු හෝ මහජන යහපතට අදාළ තොරතුරු අනාවරණය කිරීම නිසා කිසිවෙකු නීතිමය හෝ රැකියාව සම්බන්ධ දඬුවමකට ලක් කිරීම හෝ අඩුසැලකිලි දැක්වීම දඬුවම් ලැබිය හැකි වරදක් වශයෙන් නීතිගත කිරීම;

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි අදහස</u>

ඉතා වැදගත්ය.

<u>රජයේ පුවෘත්ති දෙපාර්තමේන්තුවේ යෝජනාව</u>

6. පිළිගත් වෘත්තීය ආචාරධර්ම සංග්‍රහය (recognised professional codes of practice) කඩ කිරීම ප්‍රතික්ෂේප කරන ජනමාධ්‍යවේදියෙකුට හෝ සංස්කාරක වරයෙකුට දඬුවම් කිරීම හෝ සේවය අවසන් කිරීම හෝ නීති විරෝධී ක්‍රියවක් වශයෙන් සැලකීම;

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි අදහස</u>

මෙම වගන්තියද වඩා නිරවුල් විය යුතුය. මේ සඳහා සංස්කාරක ස්වාධීනත්වය පිළිබඳ අන්තර් ජාතික ප්‍රමිතීන් පිළිගැනීම අවශ්‍ය ය. එනම් හිමිකරු විසින් සිය පුවත්පත්හි ආචාර ධර්ම පද්ධතිය සහ සංස්කාරක පිළිවෙත ලිඛිතව එම ආයතනයේ ජනමාධ්‍යවේදීන්ගේ පත්වීම් ලිපි සමඟ ලබා දීමෙන් පසු හිමිකරුවන් විසින් එකී මාධ්‍යයන්හි අන්තර්ගතයට අත නොපෙවීමයි.

හිමිකරුට සිය ආයතනයේ කවර හෝ මාධ්‍යයක සංස්කාරක වීමට අවශ්‍ය නම් එය කළ යුත්තේ නිල වශයෙනි. නමුත් අද මෙරට බොහෝ ජනමාධ්‍යයන්හි අන්තර්ගතය හිමිකරුවන් විසින් සෘජුවම පාලනය කරනු ලැබේ.ඊට විරුද්ධ වීමට මෙරට ජනමාධ්‍යකරුවනට සම්ප්‍රදායක් හෝ ශක්තියක් නැත. ඊට එක් හේතුවක් නම් ජනමාධ්‍යකරුවාට සිය අයිතීන් සඳහා වෘත්තීයම වශයෙන් එක්වීම බොහෝ හිමිකරුවන් විසින් තහනම් කොට තිබීමයි.

එබැවින් වෘත්තීය සමිති නිදහසද ඇතුළු ජනමාධ්‍යවේදීන් සතු සංවිධානයවීමේ අයිතිය නීති මගින් තහවුරු කිරීමට ආණ්ඩුව පියවර ගත යුතුය.

එමෙන්ම පුවත්පත් හිමිකාරිත්වය පාරදෘශ්‍ය විය යුතු බවටත් ලැදියාවන්හි ගැටුමක් ඇතොත් එය ප්‍රසිද්ධියට පත් කළ යුතු බවටත් සහතික කළ යුතුය.

<u>රජයේ පුවෘත්ති දෙපාර්තමේන්තුවේ යෝජනාව</u>

7. මාධ්‍ය ආයතනවලට අදාල ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූල වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයක් පිළිගෙන එය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට අවශ්‍ය බලතල සහිත ස්වාධීන මණ්ඩලයක් ස්ථාපිත කිරීම.

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි අදහස</u>

ඉතා වැදගත් නමුත් අසීරු කරුණකි. එවැනි මණ්ඩලයක අවශ්‍යතාවය අද හදිසි වුවමනාවකි.

විදේශයන්හි සාර්ථකව ක්‍රියාත්මක වන මෙවැනි යාන්ත්‍රණයන්හි අත්දැකීම් අධ්‍යයනය කිරීම මේ සඳහා වැදගත්ය. එමෙන්ම මෙවැනි මණ්ඩලයක වියදම් පියවා ගැනීම පිනිස මාධ්‍ය ආයතන මත බද්දක් පැනවීම ද සලකා බැලිය යුතුය.

ජනමාධ්‍ය අන්තර්ගතය පමණක් නොව ඒවායේ ප්‍රචාරය වන වෙළඳ දැන්වීම් සම්බන්ධයෙන්ද ප්‍රමිතියක් ඇති කිරීමත් ඒවා නිරීක්ෂණය කිරීමත් අත්‍යවශ්‍යය. මෙරට වෙළඳ දැන්වීම් ප්‍රමිති ආයතනයක් ඇතත් එය ක්‍රියාකාරී බවක් නොපෙනේ. වත්මනෙහි ආචාර ධර්ම ප්‍රමිතීන් කෙලෙසන වෙළඳ දැන්වීම් බොහෝය.

පුවත්පතක අන්තර්ගතයෙන් සියයට කොපමණ ප්‍රමාණයක් වෙළඳ දැන්වීම් වෙනුවෙන් වෙන්කළ හැකි උපරිම සීමාව කුමක්ද? ටෙලි නාට්‍ය අතරතුර ප්‍රචාරය කළ හැකි වෙළඳ දැන්වීම් වෙලාව

කොපමණද යනාදිය මාධ්‍ය හිමිකරුවන්, මාධ්‍යවේදීන් සහ සිවිල් සමාජයේ සහභාගිත්වයෙන් තීරණය කළ යුතුය.

මේ සම්බන්ධයෙන් ක්‍රියාවට නැගිය හැකි පියවරක් නම් ස්වාධීන සිවිල් මාධ්‍ය නිරීක්ෂණ ජාලයක් පවත්වා ගැනීමට ආණ්ඩුව සහය වීමයි.

<u>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ යෝජනාව</u>

මෙකී යෝජිත ස්වාධීන මණ්ඩලය ජනමාධ්‍යයේ ස්වයං නියාමන විධික්‍රමය අධීක්ෂණය කරන අතර, හිතාමතා වෘත්තීය ආචාරධර්ම සංග්‍රහය කඩකරන අවස්ථාවල දී ඒ සම්බන්ධ තහංචි පැනවීමට ද එයට බලය හිමි වෙයි. තොරතුරු අයිතිය පිළිබඳ කොමිසමේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට අනුගමනය කළ විධි ක්‍රමය මෙකී මණ්ඩලයේ ස්වාධීනතාවය තහවුරු කිරීම පිණිස ද අනුගමනය කළ හැකිය. මණ්ඩලයේ සංයුතියෙන් තුනෙන් දෙකක් ජනමාධ්‍ය ප්‍රකාශකයන් හා ජනමාධ්‍යකරුවන්ගේ සංවිධාන මගින් යෝජනා කරන විශිෂ්ඨ පුද්ගලයන්ගෙන් ද ඉතිරිය සිවිල් සමාජ සංවිධාන මගින් යෝජනා කරන විශිෂ්ඨ පුද්ගලයන්ගෙන් ද සමන්විත විය හැකිය.

යෝජිත මණ්ඩලය කෙරෙහි මහජන විශ්වාසය ඇති කිරීම පිණිස ශ්‍රී ලංකා නීතිඥ සංගමය විමසා අධිකරණ සේවා කොමිසම විසින් නම් කරනු ලබන අධිකරණ විනිසුරුවරයෙකු එහි සභාපති වශයෙන් සේවය කිරීමට පත් කළ හැකිය. ව්‍යවස්ථා සභාවේ යෝජනාවකට අනුව පාර්ලිමේන්තු ඡන්දයක් මගින් පමණක් ඉවත් කළ හැකි අන්දමට විධිවිධාන යෙදීමෙන් මේ මණ්ඩලයේ සාමාජියන්ගේ නිල කාලය සුරක්ෂිත කළ හැකිය.

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි  අදහස</u>

ඉතා වැදගත්ය. මෙම මණ්ඩලය යටතෙහි රාජ්‍ය පාලිත ජනමාධ්‍ය සම්බන්ධයෙන් වෙනත් අනු කමිටුවක් පත් කළ යුතුය.

එමෙන්ම මෙම මණ්ඩලය යටතෙහි සිවිල් සමාජීය නිරීක්ෂණ ජාලයක් ඇති කිරීම සම්බන්ධයෙන් ද සලකා බැලිය හැකිය.

<u>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ යෝජනාව</u>

පහත දැක්වෙන කාර්ය සහ බලතල යෝජිත මණ්ඩලයට අදාල වෙයි.

ඒ ඒ අංක යටතෙහි අප අදහස් දක්වා ඇත.

1. ජනමාධ්‍යවේදීන්ගේ හා සංස්කාරකවරුන්ගේ සංවිධාන හා සමිති ද, සිවිල් සමාජය ද ඇතුලත්වන කතිකාවකට අනුව උචිත වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයක් පිළිගැනීම;

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි  අදහස</u>

ඉතා වැදගත්ය. දැනට ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සහ පුවත්පත් හිමිකරු සංගමය විසින් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය යටතේ පිළිගෙන ඇති ආචාර ධර්ම පද්ධතිය මේ සඳහා ආරම්භක් ලෙස යොදා ගත යුතුය.

අවශ්‍ය වන්නේ ආචාර ධර්ම පද්ධතියක් පමනක් නොවේ. ගුණාත්මක වශයෙන් උසස් මහජන සේවා ජනමාධ්‍ය අගයන් ප්‍රවර්ධනය කිරීම උදෙසා පියවර ගනු ලැබීමද අත්‍යවශ්‍ය ය. එහිලා ප්‍රවෘත්ති කාමරයේ විවිධත්වය සහ මෙන්ම පිළිතුරු දීමේ අයිතිය තහවුරු කිරීම ද සැලකිල්ලට ගත යුතුය.

2. පිළිගත් වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහය ජනමාධ්‍ය විසින් නිසිලෙස පිළිපදිනු ලබන්නේ ද යන්න නිරීක්ෂණය කිරීම;

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි  අදහස</u>

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය යටතේ පිළිගෙන ඇති ආචාර ධර්ම පද්ධතිය කෙළෙසීම් නිරීක්ෂණය කිරීම සඳහා පිහිටුවා ඇති ශ්‍රී ලංකා පුවත්පත් කොමිසම අසාර්ථක වී තිබේ. එයට සියළු මුද්‍රිත මාධ්‍ය බැඳී නැති අතර එහි බලාධිකාරය විසින් ඉඩ සලසා ඇති පරිදි පැමිණිළි ලැබෙන තුරු බලා නොසිට ආචාර ධර්ම කෙළෙසීම් ගැන පියවර ගැනීමට එක් අවස්ථාවකදී හෝ පියවර ගෙන නැත. එබැවින් මේ සඳහා නව යාන්ත්‍රණයක් අවශ්‍ය ය. එමෙන්ම එය සහමුලින්ම රඳා පවතින්නේ විදේශ ආධාර මතය. මෙම මාදිලිය චිරස්ථායී එකක් නොවේ.

3. පිළිගත් වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහය කඩකිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ නිරීක්ෂණ හා ලැබෙන පැමිණිලි වලට අනුව විභාග කොට තීරණය කිරීම;

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි  අදහස</u>

ඉතා වැදගත්ය.

4. ජනමාධ්‍ය විසින් වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහය පිළිපදිනු ලබන අන්දම සම්බන්ධයෙන් මහජන මතය විමසීම පිණිස කලින් කල විවෘත මහජන උපදේශන පැවැත්වීම;

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි  අදහස</u>

ඉතා වැදගත්ය.

5. ලියාපදිංචි මාධ්‍ය ආයතන සම්බන්ධ දත්ත ගබඩාවක් පවත්වා ගැනීම;

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි  අදහස</u>

එවැනි දත්ත ගබඩාවක් පුවත්පත් පිළිබඳ සාමාන්‍ය තොරතුරු පමනක් නොව හිමිකරුවන් සහ ඔවුන්ගේ අනෙක් වානිජ ව්‍යාපාර, සේවයේ යොදවා ඇති ජනමාධ්‍යවේදීන් ප්‍රමාණය, අලෙවි වන පුවත් පත් ප්‍රමාණය, එහි සංස්කාරක පිළිවෙත, එය විසින් පිළිගෙන ඇති ආචාර ධර්ම පද්ධතිය, ජනමාධ්‍යවේදීන් විසින් පවත්වාගෙන යන වෘත්තීය ආයතන යනාදිය පිළිබඳවද තොරතුරු ඇතුළත් විය යුතුය.

6. වෘත්තීය අචාර ධර්ම සංග්‍රහය ඵලදායී ලෙස භාවිතා කිරීමට අවශ්‍යවන අධ්‍යාපනික කටයුතු සහ පුහුණු කිරීම්වල යෙදීම සහ එවැනි පුහුණු කිරීම් වලට සහාය දැක්වීම සහ ඒ සඳහා අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය පිළියෙල කිරීමට සහාය දැක්වීම.

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි  අදහස</u>

මේ සඳහා ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලය සමඟ කටයුතු කිරීම වඩා යෝග්‍ය විය හැකි අතර එය රාජ්‍ය - පුද්ගලික ව්‍යවසායක් ලෙස පවත්වා ගෙන යා හැකි දැයි විමසා බැලීම වටී.  එමෙන්ම ජනමාධ්‍ය පුහුණුව කිරීම සඳහා මේ වන විට විවිධ ජනමාධ්‍ය සංවිධාන විසින් සකස් කර ඇති පුහුණු ද්‍රව්‍ය එක්තැන් කිරීමටත් පළපුරුදු ජනමාධ්‍ය පුහුණුකරුවන් සහ අදාළ විද්වත් පිරිස් සමඟ සාකච්ඡා කර ඒවා යාවත් කාලීන කිරීමට පියවර ගත යුතුය.

භාෂා ප්‍රවිනත්වය ජනමාධ්‍යවේදය සඳහා අත්‍යවශය සුදුසුකමක් සේ සැලකිය යුතු අතර ජනමාධ්‍ය විසින් නිවැරදිව බස හසුරුවන බව සහතික කිරීම පිනිස අවශ්‍ය පියවර ගැනීම කෙරෙහිද සැලකිලිමත් විය යුතුය.

7. මණ්ඩලයේ තීරණවලට එරෙහිව අධිකරණයට අභියාචනා කිරීමට ඇති අයිතිය ද සහිතව, තොරතුරු අයිතිය පිළිබඳ කොමිසමට අයත් බලතලවලට සමාන බලතල යොදා ගනිමින්, මණ්ඩලයට ලැබෙන පැමිණිලි විභාග කිරීම.

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි අදහස</u>

ඉතා වැදගත්ය.

8. එම විභාගවලට අනුව වැරදිකරුවන් වන මාධ්‍ය ආයතනවලට අවවාද කිරීම හෝ මණ්ඩලයේ තීරණය මණ්ඩලය විසින් අනුදත් ආකාරයකට පළ කිරීමට හෝ ප්‍රචාරය කිරීමට හෝ අදාළ ජනමාධ්‍ය ආයතන වලට නියම කිරීම.

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි අදහස</u>

ඉතා වැදගත්ය.

9. වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහය පිළිපැදීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය සේව්‍යයන් සහ සේවකයන් අතර ඇතිවිය හැකි ගැටුම් සමථයකට පත් කිරීම.

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි අදහස</u>

ඉතා වැදගත්ය.

මේ සඳහා යෝජනා කිරීමට අදහස් කරන නීතිය සියලු මුද්‍රිත හා විද්‍යුත් ප්‍රවෘත්ති මාධ්‍ය වලටත් මණ්ඩලය විසින් අනුදත් වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහය පිළිපැදීමට විධිමත් ලෙස එකඟ වන ප්‍රවෘත්ති වෙබ් අඩවි වලටත් අදාල වේ.

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි අදහස</u>

ඉතා වැදගත්ය.

යෝජිත ස්වාධීන මණ්ඩලයේ තීරණ අනුව කටයුතු කිරීම හෝ තීරණය බලාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීම ලුහුඬු අධිකරණ විනිශ්වයකින් නියම කරන දඩයකට යටත් විය හැකි වරදක් වේ. එමෙන්ම නීත්‍යානුකූලව ප්‍රවෘත්ති සහ තොරතුරු රැස්කරන ජනමාධ්‍යවේදියෙකු ට බාධා පැමිණවීම, තොරතුරු පිළිබඳ රහස්‍ය ප්‍රභවයක් එළිදරව් කිරීමට ජන මාධ්‍යවේදියෙකුට අනිසි බලපෑම් කිරීම මත වෘත්තීය අචාර ධර්ම කඩ කිරීම ප්‍රතික්ෂේප කරන ජනමාධ්‍යවේදියෙකුට එරෙහිව ක්‍රියා කිරීම මෙම නීතියට අනුව දඬුවම් ලැබිය හැකි වරදකි.

<u>ශ්‍රී ලංකා බ්‍රීෆ් හි අදහස</u>

ඉතා වැදගත්ය.